# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 12 /2014

අංක 20 වෝඩ් පෙදෙස
කොළඹ 07

2014 නොවැම්බර් මස 13 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල කාර්ය මණ්ඩල සඳහා අන්තර් දීමනා ගෙවීම</u>**

2015 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල කාර්ය මණ්ඩල සඳහා යෝජිත නව වැටුප් ව්‍යුහය ක්‍රියාත්මක වන තුරු අන්තර් දීමනාවක් ගෙවීම සඳහා නිකුත් කර ඇති 2014.11.12 දින දරණ, මේ සමඟ අමුණා ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2014 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2. ඒ අනුව දැනට ගෙවනු ලබන වැටුප් හා අනෙකුත් දීමනාවන්ට අමතරව, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට රු.3000/- ක මාසික අන්තර් දීමනාවක් ගෙවීමට උසස් අධ්‍යාපන ආයතන කටයුතු කළ යුතු වේ.

3. අන්තර් දීමනාව ගෙවීම පහත ආකාරයට විය යුතුය ;

| වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප (මාසික) | සිට | දක්වා |
|---|---|---|
| රු. 24725/- ට අඩු | 2014 නොවැම්බර් | 2015 ජුනි 30 |
| රු. 24725/- හෝ ඊට වැඩි | 2014 නොවැම්බර් | 2015 අගෝස්තු 31 |

4. තාවකාලික පදනම මත සේවයේ නියුතු සේවකයින්ට ඉහත 3 හි සඳහන් වර්ගීකරණයට අදාල වන පරිදි අන්තර් දීමනාව ගෙවිය යුතුය.

5. අනියම් පදනම මත දෛනික වේතනය ලබන සේවකයින්ට ද එක් එක් මාසයේ සේවය කර ඇති එක් දිනකට 1/30 බැගින් වන සේ අන්තර් දීමනාව ගෙවීමට කටයුතු කළ යුතුය.

6. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ, මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත් :
1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරි
9. මූල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙ.ස.පුස්තකාලයාධිපතිවරුන්/ ස. පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන/ මණ්ඩපවල ජ්‍යෙ.ස.ලේඛකාධිකාරිවරුන්/ ස.ලේඛකාධිකාරිවරුන්
12. උසස් අධ්‍යාපන ආයතන/ මණ්ඩපවල ජ්‍යෙ.ස.මූල්‍යාධිකාරිවරුන්/ ස.මූල්‍යාධිකාරිවරුන්
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන ජ්‍යෙ.ස.අභ්‍ය.විගණකවරුන්/ ස.අභ්‍ය.විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති.

ගොනු අංකය : යූජීසී/එච්ආර්/2/9/86
T/-